


# උපහාරයක සතුට

කෙනෙකුගේ නිර්මාණයක් තවකෙක් ඇගයීම, එම නිර්මාපකයාගේ සතුටට හේතුවක්. ඒ වගේම එම අදාළ පුද්ගලයාගේ නිර්මාණ ශක්තිය වැඩි දියුණු කර ගැනීමට පිටුවහලක්, රුකුලක්.

එමෙන්ම එක් පුද්ගලයෙකුගේ ක්ෂේත්‍ර කිහිපයක් නියෝජනය වන නිර්මාණ ගනනාවක් විද්වත් පිරිසක් මඟින් විශේෂිත වූ පිරිසක් ඉදිරිපිටදී ඇගයීමට ලක්වීම එම පුද්ගලයාට කරව විශේෂ ගෞරවයක් ලෙස සඳහන් කළ හැකියි.

එවන් වූ නිර්මාණ ඇගයීමේ උළෙලක් දැක බලා ගැනීමේ අවස්ථාවක්, පසුගිය අගෝස්තු 29, සෙන-සුරාදා, උදා වුනා. මෙසේ ඇගයීමට ලක් වූ අපේ කලා කරුවා වූයේ, සිසිර දිසානායකයන්ය.

ගේය පද, චිත්‍ර, ඉංජිනේරු යන ක්ෂේත්‍රයන්හි, සිසිර පදනමේ නිර්මාතෘ මධු නානායක්කාර පවසයි.

''හෙළ මාත්‍රා සංස්කෘතික පදනම''මෙල්බර්න් නුවර අරටු බැසගත් සංවිධානයක් නොවේ. මේ' පුර මෙතෙක් බිහි වූ සංවිධාන වලට සාපේක්ෂව බැලූ කල මෙය, නිර්මාතෘවරියගේ වචනයෙන්ම කියතොත් '' වසර තුනකට නොවැඩි, ලබාල අවධියක පසුවන'' සංවිධානයකි.

මෙල්බර්න් නුවර නිර්මාණ කරුවන්ගේ නිර්මාණ ඇගයීම් උළෙල සංවිධානය කිරීම, එම පදනමේ මූලික අරමුණු අතරේ තිබූ බව මම නොසිතමි. හේතුව, පදනමේ අරමුණ මේ'පුර වසන තරුණ ළමා වයස් කාණ්ඩයේ සිටින අයට ජන ගී, ජන නැටුම්,ජනකතා, ආශ්‍රයෙන් බිහි වූ නාට්‍ය ගැන ඔවුන් දැනුම්වත් නිරීම සහ, බෙර වාදනය, චිත්‍ර කර්මය, කැටයම් ශිල්පය හා අත්කම් පිළිබඳ



තුළ වූ කුසලතා ඇගයීම '' සිසිර සරණීය'' තුළින් සිදු වුනා. ඒත්, ''මගේ ඇසින්'' මේ දකින්නේ සිසිරගේ අගැයීම් උළෙල සංවිධානය කළ හා එයට උර දුන් පිරිස පිළිබඳවයි.

මෙල්බර්න් 3zzz ගුවන් විදුලියේ කැඳවුම්කරු වන, විල්ෆ්‍රඩ් සිරිවර්ධන මහතා, සිසිර දිසානායකයන් සමඟ පැවැත් වූ සම්මුඛ සාකච්ඡාවක් ශ්‍රවණය කිරී-මෙන් ඇති වූ කම්පනය, මෙම උළෙල සංවිධානයට හේතු වූ බව, මෙල්බර්න් හෙළ මාත්‍රා සංස්කෘතික නොමිලයේ දැනුමක් ලබා දීම බැවිනි.

''සිසිර සරණි'' ඉතාමත් සාර්ථක ලෙස සංවිධානය කර තිබූ බව නොරහසකි. මෙම සාර්ථකත්වයට බල පෑ හේතු ගණනාක්ම ඇත. මධු නා-නායක්කාර මහත්මිය බලාපොරොත්තු වූ ආකා රයටම, බොහෝ අයගේ අධාර උපකාර ලැබුනේ ඇගේ මේ පහන් සිතුවිල්ල නිසාමය.

'' සිසිර දිසානායක මාගේ චිත්‍ර කර්ම පංතියේ ඉගෙන ගන්න ළමයින්ට උපදේශකයෙක් බව දැනගෙන සිටියා මිසක්, මේ තරම් විශාල ගීත සංඛාවක් මේ තරම් ප්‍රවීණ ගායක ගායිකාවන් පිරිසකට, මේ තරම් මේ'පුර ගායික ගායිකාවන් පිරිසකට ගීත රචනා කර දී ඇති බව මම දැනගෙන සිටියේ නෑ''

අය මේ සියල්ල ගැන දැනුම්වත් වී ඇත්තේ 3zzz ගුවන් විදුලියෙන් ප්‍රචාරණය වුන වැඩසටහනකට සවන් දීමෙනි.

කෙසේ හෝ,මදු නානයක්කාර මහත්මිය ,නියම වෙලාවට, නියම ආකාරයට ම නියම ශිල්පියා තෝරාගෙන, මෙවන් නිර්මාණ ඇගයුමේ උළෙලක් සංවිධානය කිරීම ගැන, කලාවට ලැදි සැමගේ ස්තුතිය හිමිවිය යුතුය

සංදර්ශණය මෙහෙය වීමේ සිට අවසාන ස්තුති කථාව දක්වා සහභාගී වූ, ඇරයුම්ලත් විද්වතුන්ගෙන්. මෙල්බර්න් ගායක ගායිකාවන් ගෙන්, ශ්‍රී ලංකාවේ සිට සුභාශිංසන ඉදිරිපත් කළ විද්වතුන්ගෙන් වේදිකාවේ සහ පිවිසුම් ගර්භයේ සැරසිලි කළ ශිල්පීන් ගෙන්, පසුබිම් සංගීතය වාදශිල්පීන්ගෙන්, සියළුම නර්තන ශිල්පීන්ගෙන්. ආලෝක කරන, ශබ්ද පරිපාලන ශිල්පීන්ගෙන් සියළුම කැමරා ශිල්පීන්ගෙන් ළමුන්ගේ දෙමව්පියන් ගෙන් මෙන්ම ආපන ශාලාවේ සහයට ඉදිරිපත් වූ සැමගෙන්මත් දිස් වූයේ ප්‍රසංගය වෙත දැක් වූ උනන්දුවයි.

මෙවන් උළෙලක් වෙනුවෙන් දරන්න සිදුවන පිරි-වැය ගැන දෙවරක් නොසිතා, උසස් ප්‍රමිතියේ ප්‍රසංගයක් කිරීමට ඇගේ තිබූ අභිලාෂය එදින මුදුන්පත් වූ බව නම් කිව යුතුමය.

සියල්ල මුදලට විකිණෙන අවදියක, ප්‍රසංගය සඳහා ප්‍රවේශ පත්‍ර අලෙවි නොකර ආරාධනා පත්‍ර යැවීමත් එදින ලබාදුන් සිසිර දිසානායකයන්ගේ සංගත තැටි සඳහා කිසිම මුදලක් ලබා නොගැනීමත් ආහාර පාන කිසිම මුදලකින් තොරව සැමට ලබා දීමත් අගය කල යුතුය.

වරලත් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙක් වන ජගත් ජේ එදිරිසිංහයන් ගෙනුත්, මෙල්බර්න් සරසවියේ මාහාචාර්ය ප්‍රියන්ත මෙන්ඩිස් ගෙනුත්, මෙල්බර්න් නගර සභාවේ සිවිල් ඉංජිනේරුවරයෙක් වන විජය වික්‍රම කරුණාසේන ගෙනුත් එමෙන්ම සිසිරගේ පාසැල් මිතුරා වන මහේන්ද්‍ර කාලිංගමුදලි ගෙනුත් සිසිර ගැන දැන උගත් දෑ බොහෝය.

කාලයේ අවශ්‍යතාවක් හඳුනාගෙන මෙවන් උසස් ප්‍රමිතියකින් යුත් ප්‍රණාම ප්‍රසංගයක් සමාජයේ දැන උගත් පිරිසක් සහය කරගෙන, සංවිධානය කර ඉදිරිපත් කිරීම ගැන හෙළ මාත්‍රා සංස්කෘතික පදනමේ නිර්මාතෘ මධු නානායක්කාර මහත්මිය වෙත මෙසේ ප්‍රභාශිංසන පිරි නැමේ.

## Victorian School of Languages 2015 Concert - Thambapanni 2015

## වික්ටෝරියානු භාෂා පාසැලේ විවිධ ප්‍රසංගය - තම්බපණ්ණි 2015










